රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 6/2003

මගේ අංකය : ආ/III/3/5-1
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2003.05.22

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**2003 වසරේ මැයි මාසයේ ඇතිවූ ගංවතුර, සුළිසුළං**
**හා නායයාම් හේතුවෙන් විපතට පත් රජයේ නිලධාරීන්ට**
**විශේෂ අත්තිකාරම් මුදලක් ලබාදීම**

2003 මැයි මාසය තුළ රත්නපුරය, හම්බන්තොට, මාතර, ගාල්ල හා කළුතර යන දිස්ත්‍රික්කවල ඇතිවූ ගංවතුර, සුළිසුළං හා නායයාම් නිසා නිවාස, දේපල හා පෞද්ගලික බඩු බාහිරාදියට සිදුවූ අලාභහානි වෙනුවෙන් විපතට පත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පදිංචි සුදුසුකම් ලත් රජයේ නිලධාරීන්ට පොලී රහිත විශේෂ අත්තිකාරම් මුදලක් ගෙවීමට තීරණය කර ඇත.

02. මෙම විශේෂ ණය මුදල නිලධාරියාගේ එක් මාසයක දීමනා රහිත ඒකාබද්ධ වැටුපට සමාන විය යුතු අතර, සමාන මාසික කොටස් දහයකින් ආපසු අයකර ගත යුතුය.

03. ණය මුදල ඉල්ලීමේදී නිවසට හා බඩුබාහිරාදියට සිදුවී ඇති අලාභහානි පිළිබඳව ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුය.

04. මෙම ඇස්තමේන්තුව ප්‍රකාර අලාභහානි සිදුවී ඇති බව අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි සනාථ කලයුතු අතර, ප්‍රාදේශීය ලේකම් නිර්දේශ කළ යුතුය.

05. නිලධාරියා හෝ ඔහුගේ පවුලේ අය පදිංචිව සිටින්නාවූ ද, නිලධාරියාට හෝ ඔහුගේ කලත්‍රයාට හෝ අයිති වූද, නිවසකට, බඩුබාහිරාදියට අලාභහානි වී තිබේ නම් ඒවා අලුත්වැඩියා කිරීම සඳහා ද මෙම ණය ලබාගත හැකිය.

06. මෙම ණය මුදල ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3 වගන්තියේ සඳහන් වැටුපෙන් අඩුකළ හැකි මාසික අඩුකිරීම්වල එකතුවේ සීමාවන්ගෙන් නිදහස් වේ.

07. මෙම ණය මුදල සඳහා ඇපකරුවන් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. එහෙත් තාවකාලික හා අනියම් සේවකයන්ට මෙම ණය අත්තිකාරම් මුදල ගෙවන්නේ නම් රජයේ ස්ථිර සේවකයකු ඇපකරුවකු ලෙස ඉදිරිපත් කළ යුතුය.

08. 2003 ඇස්තමේන්තුවලට අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් යටතේ නියම කරන ලද උපරිම වියදම් සීමාව තුළ රැඳෙමින් මෙම ගෙවීම් කටයුතු කළයුතු වේ. කිසිම හේතුවක් නිසාවත් මෙම කරුණු හේතු කොටගෙන සීමා සංශෝධන භාරගනු නොලැබේ.

09. 2003 අගෝස්තු 31 වෙනි දිනෙන් පසු මෙම අරමුණ සඳහා ණය අත්තිකාරම් ගෙවීම නොකළ යුතුය.

10. මෙම චක්‍රලේඛය භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

**බී.ජේ.කරුණාරත්න**
ආයතන අධ්‍යක්ෂ ජනරාල්